10)

# ශ්‍රී ලංකාවේ ජනප්‍රිය පාසැල් සංකල්පය තුළින් ගොඩ නැංවෙන කාලීන සමාජීය වාතාවරණය.

ශ්‍රී ලංකාවේ කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරනු ලබන පර්යේෂණ කෘතිය.


– සූරිය ආරච්චි ගුණවර්ධන –

බී.ඒ. ( ලංකා )

අධ්‍යාපන ඩිප්ලෝමා ( ලංකා )

මහරගම විශේෂ පුහුණු 1 පෙළ ( ගණිතය )



UCLIB

379052

379052



අධ්‍යාපන පීඨය,

කොළඹ විශ්ව විද්‍යාලය,

කොළඹ – 3.


1982.04.05

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ ගුරුන්, සිසුන්, හා දෙමව්පියන්ගෙන් පමණක් නොව, පොදු ජන මතය හුවා දක්වන පාර්ලිමේන්තුව, ප්‍රසිද්ධ රැස්වීම්, පුවත්පත් .... ආදියෙන්ද විධිමත් අධ්‍යාපනය ලබා දෙන පාසැල් ව්‍යුහය උසස් - පහත් අනුවෙන් දෙකොටසකට බෙදී ඇති බවට ආන්දෝලන නැඟෙයි. රටට නිදහස ලැබීමෙන් පෙර සිට පැවැති මේ උද්ඝෝෂණය නිදහසින් පසුව වැඩි වැඩියෙන් වාද විවාදයන්ටත්, සාකච්ඡාවන්ටත් ලක් වීමෙන් තීව්‍ර විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිදහස් අධ්‍යාපනය, මව්බසින් ඉගැන්වීම, පාසැල් රජයට පවරා ගැනීම ... ආදී විවිධ සංශෝධන හා නවීකරණයන් සිදුවිය.

එහෙත් පොදුවේ ගත් කළ රටේ සියළුම සිසු දරු දැරියන්ට සම අධ්‍යාපන අවස්ථාවන් සැලසී තිබේද? පවතින අධ්‍යාපන ක්‍රමය තුළ අධ්‍යාපන අවස්ථාවන්ගේ පැහැදිලි වෙනසක් ඇති කිරීමේලා "ජනප්‍රිය පාසැල්" යනුවෙන් හැඳින්වෙන පාසැල් කීපය බොහෝ දුරට සමාජය කෙරෙහි බලපා ඇති බව පෙනී ගියෙන්, අධ්‍යාපනයට හා අධ්‍යාපනයට බාහිර වූ කවර සාධකයන් ජනප්‍රිය පාසැල් සංකල්පය තුළින් ගොඩ නැංවුන වාතාවරණය විසින් සමාජයේ සම්ප්‍රදායික පැවැත්මට බලපා ඇත්දැයි සොයා බැලීම මෙම සමීක්ෂණයේ අරමුණ විය.

ජනප්‍රිය පාසැලකට වර්ෂයක් තු ළදී ඇතුළත් කරගත්තේ සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවකි. එයද තරඟ විභාගයකින් හෝ ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් ජයග්‍රහණය කළ කීප දෙනෙකුට පමණක් ලැබෙන දුර්ලභ අවස්ථාවකි. පාසැලේ, ජනප්‍රියත්වයට කවරාකාර සාධක හේතු වේද? ජනප්‍රිය පාසැලක ඉගෙනීම හේතු කොට ගෙන සංස්කෘතික හා සාමාජීය වශයෙන් පුද්ගලයෙකුගේ ජීවිතයේ (සෙසු පාසැලක ඉගෙනීමට වැඩියෙන්) වෙනසක් සිදුවේද? ජනප්‍රිය පාසැලක් තෝරා ගැනීමට මේ තරම් තරඟකාරීත්වයක් පවතින්නේ ඇ යි? මෙසේ තරඟකාරී ලෙස ජය ලබා ජනප්‍රිය පාසැල-කට ඇතුළත් වීමෙන් පසු වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් අපේක්ෂිත අරමුණු කරා ළඟා වෙත්ද?

මෙම සාමාජීය ගැටළුව දිවයිනේ ප්‍රදේශයකට හෝ ප්‍රදේශ කීපයකට පමණක් සීමා නොවිනි. එහෙයින් පර්යේෂණයට මුළු රටම අන්තර්ගත කළ යුතු විය.

අහඹු ලෙස ගත් සිසු නියැදි දෙකක්ද (ජනප්‍රිය පාසැල් වලින් සිසු නියැදියක් හා සෙසු පාසැල්වලින් සිසු නියැදියක්) අහඹු ලෙස ගත් ගුරු නියැදියක්ද දෙන ලද ප්‍රශ්නාවලීන්ට පිළිතුරු සපයා සිය අදහස් ප්‍රකාශ කළහ. ජනප්‍රිය පාසැල් සිසු නියැදිය ශ්‍රී ලංකාවේ පළාත් නවයෙන් තෝරා ගත් ජනප්‍රිය පාසැල් 9 කින් අහඹු ලෙස ගත් සිසුන් 225 කින් සමන්විත විනි. ගුරු නියැදිය ශ්‍රී ලංකාව පුරා ජනප්‍රිය හා සෙසු පාසැල්වල සේවය කළ/කරණ විවිධ වයස් අධ්‍යාපන සුදුසුකම් හා සේවා කාලයන්ගෙන් යුක්ත වූවන්ගෙන් සැදිනි. පාසැල් දෙවර්ගයටම සම්බන්ධ දෙමාපියන්ගෙන් හා පාසැල් වල ආදි සිසුන් ඇතුළු බාහිර පුද්ගලයන්ගේ අදහස් ලබා ගන්නා ලද්දේ සම්මුඛ සාකච්ජා මගිනි. මීට අමතරව හැන්සාඩ් වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර වාර්තා, අතිරේක, ත්‍යාග ප්‍රදානෝත්සව වාර්තා ආදිය කරුණු රැස්කර ගැනීමට උපයෝගී කර ගැනිනි.

මෙසේ ලබාගත් දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රතිශත, කයිවර්ග, සහ සම්බන්ධතා වය හා ප්‍රස්ථාර යන සංඛ්‍යා විද්‍යාත්මක මාණයක් භාවිත කෙරිණි.

ඒ විශ්ලේෂණ තුළින් එළඹිය හැකි නිගමණයන් අතර ප්‍රධාන තැනක් ගන්නා කරුණු කීපයෙකි.

ජනප්‍රිය පාසැලට සෙසු පාසැල් සමග සැසඳීමේදී සාපේක්ෂ වශයෙන් වැඩි අධ්‍යාපන පහසුකම් ද ක්‍රීඩා ඇතුළු විෂය බාහිර කටයුතු සඳහා සාරවත් පරිසරයක්ද හිමි වී ඇත. අතීතියේ සිට පාසැලට උරුම වී ඇති කීර්ති නාමය රැක ගැනීමට එම පරිසරය හේතු වන අතර එය ජනප්‍රියත්වය කෙරෙහි බලපා ඇත. රාජ්‍යයක ක්‍රියාත්මක වන දේශපාලනදර්ශනය කුමක් වුවද ලෝකයේ බොහෝ රටවල් වල පවතින මෙම අධ්‍යාපන විෂමතාවය මෙහිද දක්නට ලැබෙන බව විමසීමේදී පෙනී යයි.

ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ යන අංශයන්හිත්, බුද්ධි විෂයික වෘත්තීන්හිත් (වෛද්‍ය, ඉංජිනේරු .. ආදි ) නියුක්ත වූවන්ගෙන් වැඩි දෙනා ජනප්‍රිය පාසැල් වල ආදි ශිෂ්‍යයෝය. දරුවා ජනප්‍රිය පාසැලක ඉගෙනීම මේ පසුබිම යටතේ දෙමව්පියන්ට අනාගතය කෙරෙහි වැඩි බලාපොරොත්තු තැබිය හැකි, සමාජ තත්ත්වයද පිළිබිඹු කරන ගෞරවනීය කටයුත්තකි.

ජනප්‍රිය පාසැලක සේවය කිරීම ගුරුවරයෙකු වශයෙන් වඩාත් පහසු හා වාසිදායක වුවද සෙසු පාසැල් වල උගන්වන ගුරුවරුන් ගෙන් වැඩි දෙනා ජනප්‍රිය පාසැලේ ගුරුවරයාට වැඩි තෘප්තියක් ඉගැන්වීමේ කාර්යයෙන් ලබති.

ජනප්‍රිය පා සල සමාජය තුළ සමාජ පන්ති ආකල්පය ගොඩ නංවයි. අඩු ආදායම් ලබන්නවුන්ගේ දරුවන්ට ජනප්‍රිය පාසැලක ඉගෙනීමේ අවස්ථා අඩුය. රටේ බහුතර ජන කො ටස පිළිගත් සංස්කෘතික හර පද්ධතීන්ට වෙනස් වූ උප සංස්කෘතියක් ජනප්‍රිය පාසැල් පරිසරය තුළින් ගොඩ නැංවී ඇත. තත්ත්වය මෙසේ වුවද දෙමව්පියන්ගේ අදහස් වලින් පෙනී යන්නේ ජනප්‍රිය පාසැල් හා සෙසු පාසැල් අතර සමතාවයක් ඔවුන් අපේක්ෂා නොකරන බවකි.

-----